# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## සත්ව සුභසාධන

**හිංසාවෙන් සතුන් ආරක්ෂා කිරීම, සතුන් කෙරෙහි ප්‍රජාව තුළ කරුණාව, දයාව සහ වගකිවයුතු හැසිරීම වර්ධනය කිරීම; ජාතික සත්ව සුභසාධන අධිකාරියක් පිහිටුවීම; පොදුවේ සත්ව සුභසාධනය සඳහා ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා පිළිබඳව විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී පූජ්‍ය අතුරලියේ රතන හිමි විසින් 2010 ඔක්තෝබර් මස 19 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2010 ඔක්තෝබර් මස 04 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[43 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 28.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

# සත්ව සුභසාධන

**හිංසාවෙන් සතුන් ආරක්ෂා කිරීම, සතුන් කෙරෙහි ප්‍රජාව තුළ කරුණාව, දයාව සහ වගකිවයුතු හැසිරීම වර්ධනය කිරීම; ජාතික සත්ව සුභසාධන අධිකාරියක් පිහිටුවීම; පොදුවේ සත්ව සුභ සාධනය සඳහා ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා පිළිබඳව විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2010 අංක    දරන සත්ව සුභසාධන පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක ක්‍රියාත්මක විය යුතු ය: ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

එතෙකුදු වුව ද, මෙම පනතේ විවිධ කොටස් සඳහා අමාත්‍යවරයා විසින් විවිධ දින නියම කරනු ලැබිය හැකි ය.

## I වන කොටස

## අරමුණු

**2.** මෙම පනතේ අරමුණු වනුයේ— අරමුණු.

(1) සතුන්ට මානුෂිකව සැලකීමට සහ එම සතුන්ගේ සුභසාධනය සැලැස්වෙන බවට වගබලා ගැනීමට අවශ්‍ය සියලුම සාධාරණ පියවර ගැනීමට සතුන් භාරව කටයුතු කරන තැනැත්තන්ට ඇති වගකීම පිළිගැනීම;

(2) සතුන්ට හිංසා කිරීම වැළැක්වීම සහ සතුන්ට ආරක්ෂාව සහ සුභසාධනය ලබා දීම, සතුන් සම්බන්ධයෙන් ඇතැම් ගණවලට අයත් හැසිරීම තහනම් කිරීම සහ නීතිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් දඬුවම් පැමිණවීම;

(3) ජාතික සත්ව සුභසාධන අධිකාරියක් පිහිටුවීම සහ සත්ව සුභසාධනය සඳහා නියෝග සහ ව්‍යවස්ථා සංග්‍රහ සඳහා විධිවිධාන සැලැස්වීම; සහ

(4) සත්ව සුභසාධනය සම්බන්ධයෙන් ප්‍රජාවගේ දැනුවත්භාවය වැඩි කිරීම.

## II වන කොටස

### ජාතික සත්ව සුභසාධන අධිකාරිය

ජාතික සත්ව සුභසාධන අධිකාරිය.

3. (1) ජාතික සත්ව සුභසාධන අධිකාරිය යයි කියනු ලබන (මෙහි මින් මතු "අධිකාරිය"යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියක් පිහිටුවනු ලැබිය යුත්තේ ය.

(2) අධිකාරිය, (1) වන උප වගන්තිය මගින් එයට දී ඇති නාමයෙන්, සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර, එම නමින් නඩු පැවරීමට හෝ පවරනු ලැබීමට හැකි වන්නේ ය.

අධිකාරියේ සංයුතිය.

4. අධිකාරිය පහත සඳහන් වන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුත්තේ ය:—

(අ) අමාත්‍යවරයා විසින් පහත සඳහන් පරිදි පත් කරනු ලැබිය යුතු (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තන් දහදෙනකු—

(i) සත්ව සුභසාධන සංගම් විසින් නම් කරනු ලබන තැනැත්තන් අතරින් සත්ව සුභසාධනය පිළිබඳව පුළුල් පළපුරුද්දක් ඇති තැනැත්තන් හය දෙනකු, ඒ අතරින් යටත් පිරිසෙයින් එක් කෙනකු නීතිඥවරයකු විය යුත්තේ ය;

(ii) ශ්‍රී ලංකාවේ පශු වෛද්‍ය සභාව විසින් නම් කරනු ලබන පශු වෛද්‍ය විද්‍යා සුදුසුකම් ඇති තැනැත්තන් දෙදෙනකු;

(iii) ආයුර්වේද වෛද්‍ය සභාව විසින් නම් කරනු ලබන, සතුන්ට ප්‍රතිකාර කිරීමේ පළපුරුද්ද ඇති ආයුර්වේද වෛද්‍යවරයකු වන එක් තැනැත්තකු; සහ

(iv) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන, ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්ව විද්‍යාලයක සායන පශු වෛද්‍ය විද්‍යා පිළිබඳ මහාචාර්යවරයකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු වන එක් තැනැත්තකු; සහ

(ආ) පහත සඳහන් වන නිල බලයෙන් පත්වන සාමාජිකයන්, එනම්:—

(i) වන සත්ව සංරක්ෂණ අධ්‍යක්ෂ හෝ ඔහුගේ නාමිකයකු;

(ii) ජාතික සත්ව උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ හෝ ඔහුගේ නාමිකයකු;

(iii) මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහුගේ නාමිකයකු;

(iv) 1991 අංක 59 දරන සත්ව රෝග පනත යටතේ පත් කරන ලද සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහුගේ නාමිකයකු;

(v) පොලිස්පති හෝ නියෝජ්‍ය පොලිස්පති තනතුරකට නොඅඩු තනතුරක් දරන ඔහුගේ නාමිකයකු; සහ

(vi) සෞඛ්‍ය අමාත්‍යාංශයේ මහජන සෞඛ්‍ය සේවාවන් භාර අධ්‍යක්ෂ හෝ ඔහුගේ නාමිකයකු.

සාමාජිකයකු වීමට නුසුදුසුවීම.

5. යම් තැනැත්තකු—

(අ) පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ වුවහොත්; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ පුරවැසියකුවීම අවසන් වුවහොත්; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්වන්නාවූ යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට තීරණය කරනු ලැබ තිබේ නම් හෝ ප්‍රකාශයට පත්කරනු ලැබ තිබේ නම්; හෝ

(ඈ) බුන්වත් හෝ වස්තු භංගත්වයට පත් තැනැත්තකු වශයෙන් පත් කරනු ලැබ නිදහස් නොකළ බුන්වත් හෝ වස්තු භංගත්වයට පත් තැනැත්තකුව සිටීනම්; හෝ

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් නියම කරන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම් හෝ කලින් අවුරුදු හත තුළ කවර වූ හෝ අවස්ථාවක විඳ ඇත්නම් හෝ ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක සත්ව ආරක්ෂාව හෝ සුභසාධනය සම්බන්ධ නීතියක් යටතට ගැගෙන යම් වරදක් සඳහා අධිකරණයක් විසින් කවර අවස්ථාවක හෝ වරදකරු කරනු ලැබ ඇත්නම්; හෝ

(ඊ) අධිකාරිය විසින් හෝ වෙනුවෙන් හෝ සාදන ලද යම් ගිවිසුමක් යටතේ යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් දරන්නේ හෝ භුක්ති විඳින්නේ නම්; හෝ

(උ) අධිකාරියේ සාමාජිකයකු වශයෙන් තමාගේ කාර්යයන් ඉටු කිරීම කෙරෙහි අගති සහගතව බලපෑමට යටත් විය හැකි යම් මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් ඇත්නම්, හෝ

ඒ තැනැත්තා අධිකාරියේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු වශයෙන් කටයුතු කරගෙන යාමට සුදුස්සකු නොවිය යුතු ය.

සාමාජිකයන් ඉල්ලා අස්වීම සහ ඉවත්කිරීම.

**6.** (1) අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්වීමට අධිකාරියේ පත් කළ සාමාජිකයකුට හැකි අතර, ඒ ඉල්ලා අස්වීම, අමාත්‍යවරයා විසින් එම ලිපිය පිළිගනු ලබන දිනයේ සිට බලාත්මක විය යුතු ය.

(2) අධිකාරියේ පත්කළ සාමාජිකයකු සඳහන් කරනු ලබන හේතු මත අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) අධිකාරියේ සාමාජිකයකු මියගියහොත් හෝ ධුරයෙන් ඉල්ලා අස්වුවහොත්, හෝ ඉවත් කරනු ලැබුවහොත්, අමාත්‍යවරයා විසින් 5 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ඔහු වෙනුවට වෙනත් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයකු ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

සාමාජිකයන්ගේ ධුර කාලය.

**7.** අධිකාරියෙහි, පළමුවරට පත් කරනු ලැබූ සාමාජිකයන් සම්බන්ධයෙන් වන විට, ඔවුන්ගේ පත්වීම් ලිපිවල නිශ්චිතව සඳහන් කර ඇති ආකාරයට ඔවුන් අතරින්, දෙදෙනකු අවුරුදු දෙකක කාලපරිච්ඡේදයක් සඳහා ධුර දැරිය යුත්තේ ය. දෙදෙනකු අවුරුදු තුනක කාලයක් සඳහා ධුර දැරිය යුත්තේ ය. තිදෙනකු අවුරුදු හතරක කාල පරිච්ඡේදයක් සඳහා ධුර දැරිය යුත්තේ ය. තිදෙනකු අවුරුදු පහක කාලපරිච්ඡේදයක් සඳහා ධුර දැරිය යුත්තේ ය. එබඳු සාමාජිකයන්ට අනුප්‍රාප්තවීම සඳහා පත් කරනු ලබන සාමාජිකයන් අවුරුදු පහක කාලයක් දක්වා ධුර දැරිය යුත්තේ ය.

සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

**8.** අධිකාරියේ සාමාජිකයන්ට, අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ප්‍රමාණයන්ට අනුව, අධිකාරියේ අරමුදලින් පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

අධිකාරියේ සභාපති/ සභාපතිනිය සහ නියෝජ්‍ය සභාපති/ නියෝජ්‍ය සභාපතිනිය.

**9.** (1) පත් කළ සාමාජිකයන් අතරින් සභාපතිවරයකු/ සභාපතිනියක සහ නියෝජ්‍ය සභාපතිවරයකු/ නියෝජ්‍ය සභාපතිනියක අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය යුත්තේ ය.

(2) රෝගාතුරවීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා තම ධුරයේ කර්තව්‍ය ඉටු කිරීමට සභාපතිට/ සභාපතිනියට හෝ නියෝජ්‍ය සභාපතිට/ නියෝජ්‍ය සභාපතිනියට තාවකාලිකව නොහැකි වුවහොත්, ඔහු/ ඇය වෙනුවෙන් වැඩ බැලීම සඳහා අමාත්‍යවරයා විසින් අධිකාරියේ වෙනත් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

අධිකාරියේ රැස්වීම.

**10.** (1) අධිකාරියේ සභාපතිවරයා/ සභාපතිනිය අධිකාරියේ සෑම රැස්වීමකම මූලාසනය දැරිය යුත්තේ ය. එබඳු රැස්වීමකට සභාපති/ සභාපතිනිය පැමිණ නැත්නම්, නියෝජ්‍ය සභාපති/ නියෝජ්‍ය සභාපතිනිය එම රැස්වීමේ මූලාසනය දැරිය යුත්තේ ය. සභාපති/ සභාපතිනිය සහ නියෝජ්‍ය සභාපති/ නියෝජ්‍ය සභාපතිනිය යන දෙදෙනාම එබඳු රැස්වීමකට පැමිණ නැත්නම් පැමිණ සිටින සාමාජිකයන් අතරින් තෝරා පත් කරගනු ලබන සාමාජිකයකු එම රැස්වීමේ මූලාසනය දැරිය යුත්තේ ය.

(2) අධිකාරියේ යම් රැස්වීමක ගණපූරණය, සාමාජිකයන් හත් දෙනකු විය යුත්තේ ය.

(3) අධිකාරියේ යම් රැස්වීමක මූලාසනය දරන සභාපතිට/ සභාපතිනියට හෝ නියෝජ්‍ය සභාපතිට/ නියෝජ්‍ය සභාපතිනියට හෝ අනෙකුත් සාමාජිකයාට ඔහුගේ/ ඇයගේ ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුත්තේ ය.

(4) මෙම වගන්තියේ කලින් සඳහන් වන විධිවිධානවලට යටත්ව, අධිකාරියේ රැස්වීම් සම්බන්ධයෙන් හා ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් අධිකාරිය විසින් එහි කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැක්කේ ය.

යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ පත්වීමේ දෝෂයක් හේතුවෙන් ක්‍රියා බලරහිත නොවිය යුතු බව.

**11.** අධිකාරියේ යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් අධිකාරියේ යම් ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් බල රහිත වන බව නොසැලකිය යුතු ය.

**12.** (1) අධිකාරියේ මුද්‍රාව අධිකාරිය විසින් නිශ්චය කරනු සහ සකස් කරනු ලැබිය හැකි අතර, අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන ආකාරයට වෙනස් කරනු ලැබිය හැක්කේ ය. අධිකාරියේ මුද්‍රාව.

(2) අධිකාරියේ මුද්‍රාව, අධිකාරිය විසින් කලින් කල තීරණය කරනු ලබන යම් තැනැත්තකුගේ භාරයේ තිබිය යුත්තේ ය.

(3) අධිකාරියේ අනුමැතිය ඇතිව මිස සහ සභාපති/ සභාපතිනිය සහ තවත් එක් සාමාජිකයකු ඉදිරිපිටදී හැර අධිකාරියේ මුද්‍රාව යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තබනු නොලැබිය යුතු අතර, සභාපති/ සභාපතිනිය සහ සාමාජිකයා යන දෙදෙනාම තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට තම අත්සන් තැබිය යුතු ය.

(4) අධිකාරියේ මුද්‍රාව තබනු ලැබූ සාධන පත්‍රවල හෝ ලේඛනවල නාම ලේඛනයක් අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

**13.** අධිකාරිය විසින් ස්වකීය බලතල සහ කර්තව්‍යයන් අතරින් යම් බලයක් හෝ කර්තව්‍යයක් අධිකාරියේ සභාපති/ සභාපතිනිය, නියෝජ්‍ය සභාපති/ නියෝජ්‍ය සභාපතිනිය, අධ්‍යක්ෂ, යම් කමිටුවක්, යම් නිලධරයකු හෝ අධිකාරියේ වෙනත් යම් සාමාජිකයකු වෙත පවරා දෙනු ලැබිය හැකි ය. එසේ යම් බලයක් හෝ කර්තව්‍යයක් පවරනු ලැබූ වෙනත් යම් තැනැත්තකු එසේ පවරන ලද බලය ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍යය ඉටු කිරීම අධිකාරියේ සාමාන්‍ය සහ විශේෂ විධානයන්ට යටත්ව කළ යුතු ය. අධිකාරියේ බලතල සහ කර්තව්‍යයන් පැවරීම.

III වන කොටස

**කර්තව්‍යයන් සහ බලතල**

**14.** පහත දැක්වෙන කර්තව්‍යයන්, අධිකාරියේ කර්තව්‍යයන් විය යුත්තේ ය:— අධිකාරියේ කර්තව්‍ය.

(අ) සත්ව සුභසාධනය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුවට උපදෙස් දීම;

(ආ) මෙම පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම;

(ඇ) සතුන් ආරක්ෂා කිරීම සහ සත්ව හිංසාව වැළැක්වීම සඳහා ගතයුතු පියවර සම්බන්ධයෙන් ආණ්ඩුවට උපදෙස් දීම;

(ඇ) සත්ව සුභසාධනය සම්බන්ධ නීති නිරතුරුවම සමාලෝචනයට භාජනය කිරීම සහ එබඳු නීති සම්බන්ධයෙන් කළ යුතු සංශෝධන පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම;

(ඉ) අදාළ ඒජන්සි ආයතන, පුද්ගල මණ්ඩල සහ සත්ව සුභසාධන සංවිධාන සමග සාකච්ඡා කර, අන්තර්ජාතිකව පිළිගනු ලබන ප්‍රමිතිවලට සහ හොඳම පරිචයන්ට අනුකූලවූ සත්ව සුභ සාධනයට සම්බන්ධ ව්‍යවස්ථා සංග්‍රහ සකස් කිරීම;

(ඊ) මෙම පනතේ අරමුණු සහ විධිවිධාන ගැන, ආණ්ඩුවේ ඒජන්සි ආයතන, පළාත් බලධාරීන්, පළාත් පාලන ආයතන, සත්ව සුභසාධක සංගම්, ආගමික ආයතන, පාසල් සහ වෙනත් අධ්‍යාපන ආයතන සහ පොදු මහජනයා අතරේ දැනුවත්භාවය ඇති කිරීම;

(උ) සතුන් කෙරෙහි කරුණාව, දයාව සහ වගකිවයුතු හැසිරීම වර්ධනය කිරීම;

(ඌ) මෙම පනතේ අරමුණු ප්‍රවර්ධනය කිරීමේදී සත්ව සුභසාධක සංගම් සමග සහයෝගයෙන් කටයුතු කිරීම;

(එ) සත්ව සුභසාධක සංගම් පිහිටුවීම සහ සංවර්ධනය සඳහා උනන්දුව ඇති කිරීම සහ මෙම පනතේ අරමුණු ඉටුකර ගැනීම සඳහා සත්ව සුභ සාධක සංගම්වලට මූල්‍ය සහ වෙනත් සහාය ලබා දීම;

(ඒ) සත්ව වාසස්ථානවල සහ වෙනත් ස්ථානවලදී සලස්වනු ලැබිය හැකි සතුන්ගේ වෛද්‍ය ආරක්ෂාව සම්බන්ධ යෝග්‍ය ප්‍රමිති සහ පියවර ගැන ආණ්ඩුවට උපදෙස් දීම;

(ඔ) සත්ව සුභසාධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන නෛතික, පරිපාලන සහ වෙනත් ප්‍රතිසංස්කරණ නිර්දේශ කිරීම;

(ඕ) සත්ව සුභසාධනය සම්බන්ධයෙන් මහජනයාගෙන් නියෝජන ලබාගැනීම සහ අවශ්‍ය අවස්ථාවලදී එබඳු නියෝජන අදාළ බලධාරීන් වෙත යොමු කිරීම;

(ඛ) සත්වයන්ට විරුද්ධව කෙරෙන වැරදි සම්බන්ධ විමර්ශනවල සහ අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම;

(ග) සතුන්ගේ ආරක්ෂාව, රැකවරණය සහ සුභසාධනය සැලැස්වීම සඳහා නිසි පියවර ගැනීම;

(ජ) සත්ව හිංසාවට විරුද්ධ පියවර සම්බන්ධීකරණය කිරීම සඳහා ආණ්ඩුවේ ඒජන්සි ආයතනවලට, පළාත් බලධාරීන්ට, පළාත් පාලන ආයතනවලට, රාජ්‍ය නොවන සංවිධානවලට, සත්ව සුභසාධක සංගම්වලට, ආගමික ආයතනවලට සහ පොදු මහජනයාට උපදෙස් දීම සහ සහායවීම සහ සත්ව සුභසාධනයට සම්බන්ධ කවර වූ හෝ කාරණයක් සම්බන්ධයෙන් උපදෙස් දීම;

(ට) සත්ව සුභසාධනයට සම්බන්ධ කාරණා ගැන ජාතික දත්ත සමුදායක් සකස් කිරීම සහ පවත්වාගෙන යාම;

(ඩ) සතුන් බලා ගැනීමේ සේවාවන් සපයන ආයතන, සත්ව ආරක්ෂක සේවාවන් සපයන ආයතන සහ සත්ව වාසස්ථාන අධීක්ෂණය කිරීම සහ නිරීක්ෂණය කිරීම;

(ණ) සතුන්ට මානුෂිකව සැලකීම සහ සත්ව සුභසාධනය ප්‍රවර්ධනය කිරීම සම්බන්ධ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම;

(ත) සත්ව සුභසාධනය සහ සියලුම ආකාරවල සත්ව හිංසා වැළැක්වීම සම්බන්ධයෙන් විදේශීය ආණ්ඩු, අන්තර්ජාතික සංවිධාන සහ වෙනත් රටවල සත්ව සුභසාධක සංගම් සමග සම්බන්ධීකරණය සහ තොරතුරු හුවමාරු කර ගැනීම;

(ද) සත්ව සුභසාධක සංගම් හෝ සමිති සහ සත්ව වාසස්ථාන පිළිබඳ ලේඛනයක් තබා ගැනීම සහ පවත්වාගෙන යාම; සහ

(න) මෙම පනතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට විශේෂ අරමුදල් පිහිටුවීම.

**15.** පහත සඳහන් කාරණා සඳහා අධිකාරියට බලය තිබිය යුතුය:— අධිකාරියේ බලතල.

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට ගැනීම හෝ දීම, උකස් කිරීම, බැඳ තැබීම, විකිණීම නැතහොත් අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ආ) අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි නියමයන් සහ කොන්දේසි මත සුරැකුම් ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම;

(ඇ) මුදලින් හෝ වෙනත් ආකාරයකින් තෑගි, ප්‍රදාන හෝ පරිත්‍යාග භාර ගැනීම සහ අධිකාරියේ කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා ඒවා යොදා ගැනීම;

(ඈ) අධිකාරිය විසින් පවරනු ලැබිය හැකි බලතල සහ කර්තව්‍යයන් ඉටු කිරීම පිණිස පළාත් සහ දිස්ත්‍රික්ක මට්ටමෙන් කමිටු පත් කිරීම;

(ඉ) මෙම පනත යටතේ විධිවිධාන සලස්වා ඇති කර්තව්‍යයන් සඳහා බලපත්‍ර, අවසර පත්‍ර සහ ප්‍රවීනතා සහතික පත්‍ර නිකුත් කිරීම;

(ඊ) මෙම පනත යටතේ විධිවිධාන සලස්වා ඇති පරිදි, අධිකාරියේ කාර්යය මණ්ඩලයට පත් කිරීම් කිරීම;

(උ) අධිකාරියේ නිලධාරීන් සහ සේවකයන් සඳහා සමාජ ආරක්ෂක යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ සුභසාධන සහ විනෝදවීමේ පහසුකම් සැලැස්වීම;

(ඌ) අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි ගිවිසුම්වලට ශ්‍රී ලංකාවේදී හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරදී එළඹීම සහ එම ගිවිසුම් ක්‍රියාත්මක කිරීම;

(එ) අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම;

(ඒ) සතුන්ට ආරක්ෂාව සහ රැකවරණය සැලැස්වීම සඳහා සත්ව වාසස්ථාන පිහිටුවීම;

(ඔ) සුදුසු අවස්ථාවලදී මෙම පනත යටතට වැටෙන වරදවල් සම්බන්ධයෙන් නඩු පැවරීම; සහ

(ඕ) අධිකාරියේ කර්තව්‍යයන් නිසි පරිදි ඉටු කිරීම පහසුකිරීම සඳහා අවශ්‍ය සෙසු සියලුම දේවල් කිරීම.

## IV වන කොටස

### අධිකාරියේ කාර්ය මණ්ඩලය

අධිකාරියේ කාර්ය මණ්ඩලය.

**16.** (1) අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ අධිකාරියේ කර්තව්‍ය සාර්ථකව ඉටු කිරීමට අවශ්‍ය යයි අධිකාරිය සලකන සහකාර අධ්‍යක්ෂවරුන්, සත්ව සුභ සාධන පරීක්ෂකවරුන්, නිළධාරීන් සහ සේවකයන් අධිකාරිය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ සහකාර අධ්‍යක්ෂවරුන් පත් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ, සේවයෙන් පහ කිරීමේ සහ එම නිලධාරීන්ගේ විනය පාලනය පිළිබඳ බලතල අධිකාරිය වෙත පැවරී තිබිය යුත්තේ ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් කර ඇති නිළධාරීන් හැර සෙසු නිලධාරීන් සහ සේවකයන් පත් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ, සේවයෙන් පහ කිරීමේ සහ එම අයගේ විනය පාලනය පිළිබඳ බලතල අධ්‍යක්ෂ වෙත පැවරී තිබිය යුත්තේ ය.

(4) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද නිලධාරීන්ට මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව අධිකාරිය විසින් තීරණය කරනු ලබන ආකාරයට සහ ප්‍රමාණයන්ට අනුව, පාරිශ්‍රමික ලබාදිය යුතු අතර, එබඳු සේවා කොන්දේසිවලට යටත්විය යුත්තේ ය.

(5) අධිකාරියේ ඉල්ලීම් පිට රාජ්‍ය සේවයේ යම් නිලධාරියකු, ඒ නිලධාරියාගේ හා රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, අධිකාරිය විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා අධිකාරියට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එම කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(6) රාජ්‍ය සේවයේ යම් නිලධාරියකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධාරියාට හෝ ඒ නිලධාරියා සම්බන්ධයෙන් අදාළ විය යුත්තේ ය.

(7) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට හෝ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුත්තේ ය.

(8) නිශ්චිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ඇති යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් අධිකාරියට කරනු ලබන යම් කාලයක සේවය, ඒ ගිවිසුම යටතේ ඒ තැනැත්තාගේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලැබූ සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

අධිකාරියේ අධ්‍යක්ෂවරයා.

**17.** අධිකාරියේ අධ්‍යක්ෂවරයා, අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අතර, ඔහුගේ කාර්යයන් ඉටු කිරීමේ දී අධිකාරියේ ප්‍රතිපත්ති සහ විධානයන් ට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

## V වන කොටස

## මූල්‍ය

අධිකාරියේ අරමුදල.

**18.** (1) අධිකාරියට (මෙහි මින් මතු “අරමුදල” යනුවෙන් සඳහන් කරනු ලබන) ඊටම අයත් අරමුදලක් තිබිය යුත්තේ ය.

(2) පහත සඳහන්වන මුදල් අරමුදලට ගෙවනු ලැබිය යුත්තේ ය:—

(අ) අධිකාරියේ පාවිච්චිය සඳහා ඒකාබද්ධ අරමුදලෙන් පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද සියලු මුදල් ;

(ආ) මෙම පනත යටතේ වූ බලතල, රාජකාරි සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී, ඉටු කිරීමේ දී සහ සාධනය කිරීමේ දී අධිකාරියට ලැබිය හැකි සියලු මුදල් ගණන්; සහ

(ඇ) 19 වන වගන්තිය ප්‍රකාර පිහිටුවනු ලැබූ විශේෂ අරමුදල්වලට ගෙවනු ලැබිය හැකි මුදල් ගණන් හැර කවර වූ හෝ මාර්ගයකින් තෑගි, ප්‍රදානයන් සහ පරිත්‍යාග වශයෙන් ලැබෙන සියලු මුදල්.

(3) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ අධිකාරිය විසින් එහි බලතල, කර්තව්‍ය සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී , ඉටු කිරීමේදී හෝ සාධනය කිරීමේදී අධිකාරිය විසින් දරන ලද වියදමක් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

*සත්ව සුභසාධනය සඳහා විශේෂ අරමුදල්.*

**19.** කවර වූ හෝ මාර්ගයකින්, තෑගි, ප්‍රදානයන් සහ පරිත්‍යාග වශයෙන් ලැබෙන මුදල් උපයෝගී කර ගනිමින් සත්ව සුභසාධන මධ්‍යස්ථාන, සත්ව වාසස්ථාන, සත්ව ආරෝග්‍යශාලා පිහිටුවීම සහ වෙනත් එබඳු පියවර සඳහා සහාය ලබා දීම ඉලක්ක කරගත් විශේෂ ව්‍යාපෘති හෝ වැඩසටහන් සඳහා අධිකාරිය විසින් විශේෂ අරමුදල් පිහිටුවනු ලැබිය හැකි අතර, මෙම පනතේ 20 වන සහ 21 වන වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සමග එබඳු විශේෂ අරමුදල්වලට අදාළ විය යුත්තේ ය.

*ඇතැම් බදු වලින් නිදහස.*

**20.** මුදලින් හෝ වෙනත් ආකාරයකින් අධිකාරියට කරනු ලබන සෑම පරිත්‍යාගයක්ම, 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ 31 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ කාර්යයන් සඳහා ආණ්ඩුව විසින් පිහිටුවනු ලබන අරමුදලකට මුදලින් හෝ වෙනත් ආකාරයකින් කරන ලද පරිත්‍යාගයක් හැටියට සලකනු ලැබිය යුතු ය.

*මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය කිරීම.*

**21.** (1) අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුත්තේ ය.

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීම සම්බන්ධ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අධිකාරියේ ගිණුම් විගණනයටද අදාළ විය යුත්තේ ය.

## VI වන කොටස

## ආරක්ෂාව පිළිබඳ වගකීම

*සතුන් ආරක්ෂා කිරීමේ වගකීම.*

**22.** සතෙකු භාරව සිටින තැනැත්තකු එම සතාට ආරක්ෂාව සැලැස්වීමේ වගකීමෙන් බැඳී ඇත්තේ ය.

*සතුන් භාරව සිටින තැනැත්තන්ගේ වගකීම.*

**23.** 22 වන වගන්තියේ විධිවිධානවල සාමාන්‍යත්වයට අගතියකින් තොරව—

(අ) එම සතාගේ සුභසිද්ධිය සිදුවන බවට වගබලා ගැනීම පිණිස අවශ්‍ය වන සියලුම සාධාරණ පියවර ගැනීම;

(ආ) එම සතාට අනවශ්‍ය වේදනා සහ පීඩා පැමිණවීම වැළැක්වීම; සහ

(ඇ) (i) සුදුසු වූද; සහ

(ii) එම තැනැත්තා විසින් සාධාරණ තරම් ප්‍රායෝගිකව සැපයිය හැකි,

ආහාර, ජලය, සනීපාරක්ෂක ජීවන තත්ත්වයන්, ජීවත්වීමට සැහෙන ඉඩ සහ රැකවරනය එම සතාට ලබා දීම,

සතෙකුගේ භාරය පවතින්නේ යම් තැනැත්තකුගේද එම තැනැත්තාගේ වගකීම වන්නේ ය.

## VII වන කොටස

### සත්ව හිංසාව පිළිබඳ වැරදි

**24.** තැනැත්තකු යම් සතෙකු සම්බන්ධයෙන් පහත සඳහන් යම් ක්‍රියාවක්, එනම්:— සත්ව හිංසාව.

(අ) තැලීම, පයින් ගැසීම, පමණට වඩා පිටෙහි යෑම, පමණට වඩා එළවීම, පමණට වඩා බර පැටවීම, පමණට වඩා වැඩෙහි යෙදවීම, පමණට වඩා ඇවිදවීම, වධ හිංසා පැමිණවීම, භීතියට පත් කිරීම හෝ එම සතා අනවශ්‍ය වේදනාවට සහ පීඩාවට යටත්වන පරිදි වෙනත් ආකාරයෙන් එම සතාට සැලකීම හෝ සතා භාරව සිටින තැනැත්තා වශයෙන් යම් සතෙකුට ඒ ආකාරයට සලකනු ලැබීමට ඉඩ හැරීම; හෝ

(ආ) යම් රෝගයක්, දුබලතාවක්, තුවාලයක් හෝ වෙනත් යම් හේතුවක් නිසා යම් සතෙකු යොදා ගැනීමට යෝග්‍ය නොවන යම් වැඩක් හෝ ශ්‍රමය ලබාගැනීමක් හෝ වෙනත් යම් කාර්යයක් සඳහා එම සතා යොදාගැනීම හෝ සතා භාරව සිටි තැනැත්තා වශයෙන් එබඳු යෝග්‍ය නොවන සතා එසේ යොදා ගැනීමට ඉඩ හැරීම; හෝ

(ඇ) සතෙකු එම සතාගේ ස්වාභාවික හැකියාව හෝ ශක්තිය ඉක්මවා යෑමට බලකරනු ලැබීම ඇතුළුව, එම සතාගේ සෞඛ්‍යයට සහ සුභසාධනයට අහිතකර ආකාරයට පුහුණු කිරීම; හෝ

(ඇ) සතෙකුට, යම් විෂ ද්‍රව්‍යයක් හෝ හානිකර ඖෂධයක් හෝ ද්‍රව්‍යයක්, හිතාමතාම සහ අසාධාරණ ලෙස ඇතුළු කිරීම හෝ යම් සතෙකු විසින්, එබඳු විෂක්, ඖෂධයක් හෝ ද්‍රව්‍යයක් ගැනීම හිතාමතාම හා අසාධාරණ ලෙස සිදුකිරීම හෝ සිදු කිරීමට තැත්කිරීම; හෝ

(ඉ) සතෙකු වේදනාවට භාජනය වන ආකාරයට හෝ ඉරියව්වකින් එම සතා ප්‍රවාහනය කිරීම හෝ ගෙන යෑම; හෝ

(ඊ) සතෙකුට එහා මෙහා යෑමට සාධාරණ අවස්ථාවක් ලැබෙන තරම් ප්‍රමාණවත් උසින්, දිගින් සහ පළලින් යුක්ත නොවන යම් කූඩුවක හෝ යම් ස්ථානයක සතෙකු තැබීම හෝ සීමා කර තැබීම; හෝ

(උ) සතෙකු අසාධාරණ තරම් කෙටි වූ හෝ අසාධාරණ තරම් බරින් යුතු දම්වැලකින් හෝ ලණුවකින්, අසාධාරණ තරම් දීර්ඝ කාලයක් බැඳ තැබීම හෝ සතෙකු වේදනාවට හෝ පීඩාවට යටත්වන පරිදි බැඳ හෝ සීමාකර හෝ වියගහක හෝ නගුලක බැඳ තැබීම; හෝ

(ඌ) සතකු භාරව සිටින තැනැත්තා වශයෙන් සිටිමින්, එම සතාට ආහාර හෝ ජලය හෝ වාසස්ථාන හිතාමතාම අහිමි කිරීම; හෝ

(එ) සතෙකු භාරව සිටින තැනැත්තා වශයෙන් සිටිමින් එම සතා ආහාරයට ගන්නා සතෙකු වන්නේ නම් සහ එම සතා මැරීම මෙම පනතේ විධිවිධානවලට අනුකූල වන්නේ නම් හෝ මිස එම සතා මහජනයාට බරපතලවූත් ක්ෂණිකවූත් අන්තරායක් වන්නේ නම් හෝ මිස එම සතා හෝ සතාගේ පැටවුන් මරා දැමීම; හෝ

(ඒ) සතකු භාරව සිටින තැනැත්තා වශයෙන් සිටිමින්, එම සතා අත්හැර දැමීම; හෝ

(ඔ) හිතාමතාම කරන වෙනත් යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් මගින් සතෙකු අනවශ්‍ය වේදනාවට පත් කිරීම,

සිදු කරන්නේ නම් ඔහු සතෙකු හිංසාවට පත්කිරීමේ වරදට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස් දහසකට නොවැඩි වූ දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කරනු ලැබීම යන දෙකටම යටත් විය යුත්තේ ය.

අනවශ්‍ය තරම් කෲර අන්දමින් සතෙකු මරණයට පත්කිරීම වරදක් වන බව

**25.** අනවශ්‍ය තරම් කෲර අන්දමින් සතෙකු මරණයට පත් කරන කවර වූ හෝ තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන නඩු විභාගයකින් පසුව, වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කරනු ලැබීම යන දෙකටම යටත් විය යුත්තේ ය.

ගර්භණී සතෙකු මරණයට පත්කිරීම වරදක් බව.

**26.** (1) යම් ගර්භණී සතෙකු ජනතාවට බරපතලවූත්, ක්ෂණිකවූත් අන්තරායක් වන අවස්ථාවක දී හැර, එම ගර්භණී සතා හිතාමතාම මරණයට පත්කරන හෝ දැනුවත්ව මරණයට පත්කිරීම සඳහා විකුණන හෝ බාරදෙන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂ දෙකකට නොවැඩි වූ දඩයකට හෝ අවුරුදු තුනකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ එම දඩය සහ බන්ධනාගාර ගත කරනු ලැබීම යන දෙකටම යටත් විය යුත්තේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වරදක් සම්බන්ධ නඩු කටයුත්තක දී වරද සිදුකරන ලදැයි කියනු ලබන්නේ යම් සතෙකු සම්බන්ධයෙන් ද එම සතා වරද සිදු කරන ලද අවස්ථාවේ දී ගර්භණීව සිටියේද යන ප්‍රශ්නය පැනනැගුනහොත් වරද සිදුකරන ලද අවස්ථාවේ දී සතා ගර්භණීව සිටි බව පශු වෛද්‍යවරයකුගේ අත්සනින් නිකුත් කරන ලද සහතිකයක්, අත්සන් ඔප්පු කිරීමකින් තොරව සාක්ෂියක් වශයෙන් පිළිගනු ලැබිය යුතු අතර, ඊට පටහැනිව සාක්ෂි තිබේ නම් මිස, එහි සඳහන් කර ඇති කරුණු ඔප්පු කිරීමක් විය යුත්තේ ය.

## VIII වන කොටස

### තහනම් හැසිරීම

සතුන් අල්ලා ගැනීම පිණිස උගුල් ඇටවීම.

**27.** වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂා අඥාපනතේ විධිවිධානයන්ට අගතියකින් තොරව, කිසිම තැනැත්තකු , යම් සාධාරණ නිදහසට කාරණයකින් තොරව සතෙකු අල්ලා ගැනීම, සතෙකුට හානි සිදුකිරීම හෝ සතෙකු මරණයට පත් කිරීම සඳහා උගුලක් ඇටවීම හෝ ඇටවීමට සැලැස්වීම නොකළ යුත්තේ ය.

නීති විරෝධී ලෙස පක්ෂීන් සිරකර තැබීම තහනම් බව.

**28.** කිසිම තැනැත්තකු යම් පක්ෂියකු—

(අ) එම පක්ෂියාගේ කකුළට සවිකළ වළල්ලක්, දම්වැලක්, ලණුවක් හෝ නූලක් හෝ තැතක් ; හෝ

(ආ) බෙල්ල හෝ ශරීරය වටා අවහිරයක් ; හෝ

(ඇ) හිරප්පාඩු කිරීමක්,

මගින් අඩස්සිකර නොතැබිය යුතු ය.

විලවුන් ආදිය පරීක්ෂා කිරීම සඳහා සතුන් භාවිතා කිරීම තහනම් බව.

**29.** කිසිම තැනැත්තකු විසින් විලවුන්, විලවුන් අමුද්‍රව්‍ය හෝ විලවුන් නිෂ්පාදන පරීක්ෂණයට භාජනය කිරීම පිණිස සතුන් යොදා නොගත යුතු ය.

සතුන් නීති විරෝධී ලෙස කර ඇඹීම හෝ වඳ කිරීම තහනම් බව.

**30.** යම් සතෙකු කර ඇඹීම හෝ වඳ කිරීම, පශු වෛද්‍යවරයකු විසින් හෝ ඔහුගේ අධීක්ෂණය යටතේ හෝ සිදු කරනු ලැබේ නම් මිස, කිසිම තැනැත්තකු යම් සතෙකු කර ඇඹීම හෝ වඳ කිරීම හෝ කර ඇඹීමට හෝ වඳ කිරීමට සැලැස්වීම නොකළ යුත්තේ ය.

වේදනාවට පත්වී සිටින සතෙකු නීති විරෝධී ලෙස විකිණීම තහනම් බව.

**31.** අසනීප වීම, රෝගී වීම, අත්පා සිඳීම, කුසගින්න, පිපාසය, අධික තදබදය හෝ අනිසි සැලකීම හේතුකොටගෙන වේදනාවට පත්ව සිටින යම් සතෙකු වෛද්‍ය ප්‍රතිකාර හෝ ආරක්ෂාව ලබා දීමේ කාර්යය සඳහා හැර, විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම සඳහා ගිවිසුමකට එළඹීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුත්තේ ය.

සතෙකු නීති විරෝධී ලෙස විකිණීමට තැබීම හෝ ප්‍රදර්ශනය කිරීම තහනම් බව.

**32.** යම් සතෙකුට වේදනාව හෝ විපතක් සිදුවිය හැකි අවස්ථාගත කරුණු යටතේ යම් සතෙකු විකිණීම සඳහා තැබීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුත්තේ ය.

දඩයම් කිරීම ආදිය සඳහා සතෙකු ලබා දීම තහනම් බව.

**33.** සතෙකු, වෙනත් සතෙකු විසින් දඩයම් කරනු ලැබීම, තුවාල කිරීම හෝ මරණයට පත් කරනු ලැබීම සඳහා කවර වූ හෝ ආකාරයකින් ලබා දීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුත්තේ ය.

නීති විරෝධී ලෙස සතුන් බෝ කිරීම හෝ වෙළෙඳාම් කිරීම තහනම් බව.

**34.** සතුන් බෝ කිරීමේ හෝ වෙළෙඳාම් කිරීමේ ව්‍යාපාරය සඳහා නීතියෙන් නියම කර ඇති පරිදි බලපත්‍රයක් ලබා ගැනීමෙන් තොරව එබඳු ව්‍යාපාරයක් පවත්වාගෙන නොයා යුතු ය.

තහනම් හැසිරීමක යෙදීම සඳහා දඬුවම.

**35.** 27 සිට 34 දක්වා වූ වගන්තිවල ඇතුළත් වන කවර වූ හෝ තහනමක් උල්ලංඝනය වන ආකාරයට කටයුතු කරන තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට

රුපියල් විසිදහසකට නොවැඩි දඩයකට හෝ එක් අවුරුද්දකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කරනු ලැබීම යන දෙකටම යටත් විය යුත්තේ ය.

තහනම් සිද්ධීන්.

**36.** (1) මෙහි පහත සඳහන් වන (මෙහි මින් මතු "තහනම් සිද්ධියක්" යයි සඳහන් කරනු ලබන) අවස්ථාවන් කිසිවකට කිසිම තැනැත්තකු සහභාගීවීම, ඒවා සංවිධානය කිරීම , මෙහෙයවීම, ඊට පහසුකම් සැලැස්වීම හෝ ප්‍රචාරය කිරීම නොකළ යුත්තේ ය:—

(අ) සතුන්ට තුවාල සිදුවන හෝ සතුන්ගේ ජීවිත විනාශවන ක්‍රීඩා, දඩයම් හෝ වෙනත් යම් ආකාරයක විනෝද ක්‍රීඩා; හෝ

(ආ) වෙඩි තැබීමේ හෝ දඩයම් කිරීමේ කාර්යය සඳහා කූඩුකර සිටි සතෙකු මුදා හැර වෙඩි තැබීමේ ක්‍රීඩා ඉසව්වක් හෝ තරගයක්; හෝ

(ඇ) යම් සතෙකු වෙනත් යම් සතෙකුගේ ගොදුරක් බවට පත්වන ආකාරයකට (සතෙකු ගැට ගසා තැබීම ඇතුළුව) එම සතා සිරකර තැබීම සම්බන්ධවන යම් ක්‍රීඩා ඉසව්වක් හෝ විනෝද අවස්ථාවක් හෝ වෙනත් සතෙකු සමග කලහ කිරීමට යම් සතෙකු උසි ගැන්වීම.

(2) තමා අයිතිකරු වන හෝ තමා භාරව සිටින යම් භූමි භාගයක් තහනම් සිද්ධියක් සඳහා භාවිතා කරනු ලැබීම සඳහා දැන දැනම අවසර දීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුත්තේ ය.

(3) තහනම් සිද්ධියක් සඳහා යම් සතෙකු දැන දැනම සැපයීම හෝ පුහුණු කිරීම, කිසිම තැනැත්තකු විසින් නොකළ යුත්තේ ය.

දණ්ඩනය.

(4) පූර්වෝක්ත උපවගන්තිවල විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන නඩු විභාගයකින් අනතුරුව වරදකරු කරනු ලැබූ විට රුපියල් විසිදහසක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීම හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුත්තේ ය.

මී හරකුන්, එළදෙනුන් සහ ගොනුන් ඝාතනය කිරීම තහනම් බව.

37. (1) කිසිම තැනැත්තකු විසින්—

(අ) මී හරකකු හෝ මී හරක් පැටවකු ; හෝ

(ආ) එළදෙනකු හෝ එළදෙන් පැටවකු ; හෝ

(ඇ) ගොනකු හෝ ගොන් පැටවකු ;

ඝාතනය කිරීම, ඝාතනය කිරීමට සැලැස්වීම හෝ අවසර දීම නොකල යුතු ය.

(2) මේ වගන්තියේ "මී හරකා" යන්නට පිරිමි හා ගැහැණු මී හරකකු ද, "මී හරක් පැටවා" යන්නට පිරිමි හා ගැහැණු මී හරක් පැටවකු ද, ඇතුළත් වේ.

(3) පූර්වෝක්ත උපවගන්ති කිසිවක විධිවිධාන උල්ලංඝනය කරන කවර වූ හෝ තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන නඩු විභාගයකින් අනතුරුව වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දකට නොවැඩි කාලයක් බන්ධනාගාරගත කිරීම හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුත්තේ ය.

සිව්පාවන් ඝාතනය කිරීම සම්බන්ධ කොන්දේසි.

38. (1) යම් සිව්පා සතෙකු ඝාතනය කිරීම සඳහා බලපත්‍ර ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් වෙනත් යම් නීතියක, පටහැනිව සඳහන් වන කිසිවක් නොසලකාම, පෞද්ගලික නිවාස ස්ථානය දී හෝ ව්‍යාපාරික ස්ථානයක දී හෝ පොදු ස්ථානයක දී කිසිම තැනැත්තකු විසින් සිව්පා සතෙකු ඝාතනය කිරීම හෝ ඝාතනය කරනු ලැබීමට සැලැස්වීම නොකළ යුත්තේ ය.

(2) අධිකාරිය විසින් නිකුත් කරන ලද හෝ පිළිගන්නා ලද සතුන් ඝාතනය කිරීම පිළිබඳ ප්‍රවීනතා සහතිකයක් තමන් සතුව තිබේ නම් මිස, කිසිම තැනැත්තකු විසින්, මස් හෝ මලකුනේ කිසියම් කොටසක් විකිණීමට හෝ කවරවූ හෝ කාර්යයක් සඳහා බෙදා හැරීමට අදහස් කෙරෙන යම් සිව්පාවකු ඝාතනය නොකළ යුත්තේ ය.

(3) මෙම වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන කවර වූ හෝ තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර , මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන නඩු විභාගයකින් අනතුරුව වරදකරු කරනු ලැබූ විට රුපියල් විසි දහසක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දකට නොවැඩි කාලයක් බන්ධනාගාරගත කිරීම හෝ එබඳු දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුත්තේ ය. දණ්ඩනය.

මෙම වගන්තියේ කාර්යයන් සඳහා “පොදු ස්ථානයක්” යන පාඨයට මාර්ගයක්, පාරක්, පටුමගක්, චතුරශ්‍රයක්, අංගනයක්, දෙවැටක්, ප්‍රසිද්ධ පාරක් වන හෝ නොවන දොරුවක් හෝ විවෘත ඉඩක් සහ පොදු ජනතාවට ප්‍රවේශ විය හැකි ගොඩනැගිල්ලක් ඇතුළත් වේ.

## IX වන කොටස

## සතුන් ප්‍රවාහනය කිරීම

**39.** යම් සතෙකුට අනවශ්‍ය වේදනාවකට හෝ පීඩාවකට පත්වන පරිදි එම සතා රැගෙන යෑම, ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම හෝ රැගෙන යාමට, ගෙන යාමට හෝ ප්‍රවාහනය කිරීමට සැලැස්වීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුත්තේ ය. ප්‍රවාහනය කිරීමේදී සතුන් අනවශ්‍ය වේදනාවට යටත් කිරීම තහනම් බව.

**40.** යම් සතෙකු ප්‍රවාහනය කරන යම් තැනැත්තකු පූර්වෝක්ත විධිවිධානයේ සාමාන්‍යත්වයට අගතියකින් තොරව පහත සඳහන් කාරණා සිදුවන බවට වගබලා ගැනීම එම තැනැත්තාගේ වගකීම වන්නේ ය:— සතුන් ප්‍රවාහනය කරන විට පිළිපැදිය යුතු කොන්දේසි.

(අ) නැංවීමේ දී සහ බැස්සවීමේ දී එම සතාට තුවාලයක් සිදුවීම වැළැක්වීම;

(ආ) නංවන මොහොතේ සිට බස්සවන මොහොත දක්වා එම සතා මාර්ගස්ථව සිටින මුළු කාලපරිච්ඡේදය තුළම එම සතාට ප්‍රමාණවත් ඉඩකඩ, වාතය, සනීපාරක්ෂක තත්ත්වය සහ සාධාරණ සැපපහසුව සැලැස්වීම;

(ඇ) (i) අසනීපයෙන් පෙළෙන්නාවූ ; හෝ

(ii) ගර්භණීව සිටින සහ මාර්ගස්ථව සිටිය දී හෝ රැගෙන යාමෙන්, ගෙන යෑමෙන් හෝ ප්‍රවාහනය කරනු ලැබීමෙන් පසු පැය හතලිස් අටක් තුළදී හෝ

පැටවකු ප්‍රසූත කරනු ඇතැයි සාධාරණව අපේක්ෂා කළ හැකි සතෙකු,

වෛද්‍ය ප්‍රතිකාර හෝ එම සතාගේම ආරක්ෂාව පිළිබඳ කාර්යයන් සඳහා හැර, රැගෙන යෑම, ගෙනයාම හෝ ප්‍රවාහනය නොකිරීම ;

(ඈ) යම් සතෙකු රැගෙන යෑම, ගෙන යෑම හෝ ප්‍රවාහනය සඳහා භාවිතා කරනු ලබන වාහනයක—

(i) එහි ගෙන යන සතා පහසුවෙන් බැලීම හෝ පරීක්ෂා කිරීම සඳහා පහසුකම්; සහ

(ii) එම සතා මානුෂික ආකාරයෙන් පැටවීම සහ බැස්සවීම සඳහා බෑවුම් මගක්ද තිබෙන බව ;

(ඉ) යම් සතෙකු රැගෙන යෑම, ගෙන යෑම හෝ ප්‍රවාහනය සඳහා පාවිච්චි කරනු ලබන යම් වාහනයක මතුපිට එම සතාට තුවාල සිදුවිය හැකි සිදුරු හෝ කැඩීම්වලින් තොර වන බව ;

(ඊ) යම් සතෙකු රැගෙන යෑම, ගෙන යාම හෝ ප්‍රවාහනය සඳහා භාවිතා කරනු ලබන යම් වාහනයක ප්‍රවාහනය කරනු ලබන සතාගේ ස්වභාවය, යායුතු දුර සහ කාලගුණය, උෂ්ණත්වය හා භූවිෂමතා වැනි පාරිසරික සාධක සැලකිල්ලට ගනිමින් අදාළ අවස්ථාගත කරුණු යටතේ අදාළ සතාට අවශ්‍ය ආරක්ෂාව ලැබෙන පරිදි ප්‍රමාණවත් ආවරණයක් තිබීම ;

(උ) ආක්‍රමණශීලී බවට නැඹුරු වූ සතෙකු, සෙසු සතුන් සමග ප්‍රවාහනය කරනු ලබන අවස්ථාවක දී එම සතා විසින් ප්‍රවාහනය කරනු ලබන සෙසු සතුන්ට පහරදීම හෝ පීඩාවක් සිදු කිරීම හෝ හානියක් සිදු කිරීම වැළැක්වෙන ආකාරයට ප්‍රමාණවත් පූර්වෝපාය යොදා ගෙන ඇත්නම් මිස එබඳු සතෙකු සෙසු සතුන් සමග එකට ප්‍රවාහනය කරනු නොලබන බව ;

(ඌ) යම් සතෙකු වාහනයට නංවන ස්ථානයේ සිට ඉන් බස්සවන ස්ථානය දක්වා රැගෙන යාම, ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම අනවශ්‍ය ප්‍රමාදයෙන් තොරව සහ අසාධාරණ කාලපරිච්ඡේදයක් සිර කර තැබීමෙන් තොරව සිදු කෙරෙන බව ;

(එ) සතෙකු ප්‍රවාහනය කිරීමේ දී, ප්‍රවාහනය කෙරෙන තත්ත්වය අනුව, එසේ ප්‍රවාහනය කරනු ලබන කාලය තුළ එම සතාට ආහාර සහ ජලය නොදී සිටීමට සිදුවේ නම්, එසේ ආහාර හෝ ජලය නොමැතිව සිටීම දරා ගැනීමට එම සතාට හැකිවන කාලයට වැඩි කාලයක් එම ගමන සඳහා ගත නොවන බවට සැලකිලිමත් වීම ;

(ඒ) දීර්ඝ ගමන්වලදී, ප්‍රායෝගික වන අවස්ථාවලදී, සතාට ආහාර සහ ජලය ලබාදීමටත්, සතාගේ සෞඛ්‍ය අවශ්‍යතාවන් ඉටු කර ගැනීමටත්, හැකිවන පරිදි, ගමන විටින් විට කඩකළ යුතු බව.

**දණ්ඩනය.**

**41.** (1) 39 වන හෝ 40 වගන්තිවල විධිවිධාන පිළිපැදීමට අසමත්වන හෝ උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන නඩු විභාගයකට පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක කාලයකට වැඩි නොවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ එබඳු දඩය සහ බන්ධනාගාරගත කරනු ලැබීම යන දෙකටම හෝ යටත් විය යුත්තේ ය.

(2) යම් තැනැත්තකු මෙම කොටස යටතේ වරදකට වරදකරු කරනු ලැබූ විට මෙම වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පනවනු ලැබූ යම් දණ්ඩන නියමයකට අතිරේකව සහ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වරද සිදු කිරීම සඳහා භාවිතා කරන ලද වාහනය සහ එහි සිටි සතා හෝ සතුන් රාජසන්තක කිරීමේ ආඥාවක් මහෙස්ත්‍රාත්වරයා විසින් කරනු ලැබිය හැකි ය.

(3) වාහනයේ අයිතිකරු, වරදකරු කරනු ලැබූ තැනැත්තාගේ කලත්‍රයා හෝ ළමයකු නොව තුන්වන පාර්ශ්වයක් වන අවස්ථාවකදී (2) වන ඡේදය යටතේ රාජසන්තක කිරීමේ ආඥාවක් කරනු ලැබිය යුත්තේ එබඳු ආඥාවක් කරනු නොලැබිය යුත්තේ ඇයිද යන බවට හේතු දක්වන ලෙස එම අයිතිකරුට දැනුම් දීමෙන් පමණක් වන අතර, වරද සිදු කිරීම සඳහා වාහනය භාවිතා කිරීම වැලැක්වීම සඳහා තමන් සියලුම පූර්වෝපාය යොදන ලද බව හෝ ඒ සඳහා වාහනය භාවිතා කරනු ලැබ ඇත්තේ තමන්ගේ අනු දැනුමෙන් තොරව බව වාහනයේ අයිතිකරු අධිකරණය සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත් එබඳු ආඥාවක් කරනු නොලැබිය යුතු ය:

එසේවුවද, වාහනය අයිති වන්නේ, තුන්වන වරට වරදක් කිරීම පිණිස යොදා ගත් වාහනයේ අයිතිකරුට වන අවස්ථාවකදී නම්, එම වාහනය රාජසන්තක කිරීමේ ආඥාවක් මහෙස්ත්‍රාත්වරයා කළ යුතු ය.

(4) අධිකරණයේ ආඥාවක් මගින් රාජසන්තක කරන ලද වාහනයක් හෝ සතෙකු සම්බන්ධයෙන් වන විට, එම වාහනය හෝ සතා—

(අ) එම ආඥාවට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කර නොමැති නම්, එබඳු ආඥාවකට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කිරීමට නියමිත කාලපරිච්ඡේදය අවසන් වන දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි කොන්දේසි විරහිතව රජයේ අයිතියට පත්විය යුතු ය; සහ

(ආ) එබඳු ආඥාවකට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කර තිබේ නම්, එම ආඥාව අවසාන වශයෙන් අභියාචනයේදී ස්ථිර කරනු ලැබූ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි කොන්දේසි විරහිතව රජයේ අයිතියට පත්විය යුතු ය;

(ඇ) ඒ සම්බන්ධයෙන් මෙම පනතේ විධිවිධාන ප්‍රකාර ක්‍රියා කරනු ලැබිය යුතු ය.

## X වන කොටස

### ජීවමාන සතුන් විද්‍යාත්මක කාර්යයන් සඳහා භාවිතා කිරීම

ජීවමාන සතුන් අත්හදා බැලීම ආදිය සඳහා යොදා ගැනීම.

**42.** (1) ඉගැන්වීම හෝ පර්යේෂණ හෝ අත්හදාබැලීමක් පිණිස ජීවමාන සතුන් භාවිතා කිරීමේ කාර්ය සඳහා යම් තැනැත්තකු අධිකාරියෙන් අවසර පත්‍රයක් විධි වූ පරිදි ලබාගෙන තිබේ නම් මිස, එම තැනැත්තා විසින් එම කාර්යය සඳහා ජීවමාන සතුන් භාවිතා නොකළ යුත්තේ ය.

(2) අවසර පත්‍රයක් ලබාදීම සඳහා එබඳු ඉල්ලුම් පත්‍රයක් ගැන සළකා බැලීමේදී අදාළ යයි අධිකාරිය සිතන වෙනත් සැලකිය යුතු කරුණු අතර, පරිගණක මගින් දැක්වීම්, වෙනත් ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රම, කෘත්‍රිමව නිෂ්පාදනය කරන ලද ආදර්ශයන්, ආචාර ධර්මානුකූලව ලබාගත් මළ සිරුරු සහ චිකිත්සාගාර අත්හදා බැලීම් ඇතුළු ජීවමාන සතුන් යොදාගෙන කෙරෙන අත්හදා බැලීම් සම්බන්ධ නොවන විකල්ප ක්‍රම සහ උපක්‍රම තිබීම ගැන සැලකිල්ල දැක්විය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් වන එබඳු විකල්පයන් භාවිතා කරමින්, එබඳු පර්යේෂණ පැවැත්විය හැකි බවට හෝ එබඳු ඉගැන්වීම් හෝ අත්හදා බැලීම් ඉටුකළ හැකි බවට සෑහීමට පත්වූ විට, අවසර පත්‍රයක් නිකුත් කිරීම අධිකාරිය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.

## XI කොටස
## විමර්ශනය සහ නඩු පැවරීම

*විමර්ශනවලට අපරාධ නඩු විධාන සංග්‍රහය අදාළ වන බව.*

43. මෙහි අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා තිබේ නම් මිස, මෙම පනත යටතේ සිදු කරනු ලබන සියලුම විමර්ශන, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධානවලට අනුකූලව පවත්වනු ලැබිය යුතු ය.

*සෝදිසි කිරීම ආදිය.*

44. පොලිස් පරීක්ෂකවරයකුගේ තනතුරට නොඅඩු තනතුරක් දරන පොලිස් නිලධරයකු හෝ පරීක්ෂකවරයකු වරෙන්තුවක් ලබාගැනීමෙන් අනතුරුව—

(අ) යම් ස්ථානයක මෙම පනත යටතේ වරදක් සිදු කර ඇති බව හෝ සිදු කරනු ලබන බව හෝ සිදු කරනු ලැබීමට අත්‍යාසන්න බව විශ්වාස කිරීමට තරම් හේතු එම නිලධරයාට තිබේ නම් එම ස්ථානයට ඇතුළ්වී පරීක්ෂා කිරීමට;

(ආ) එම ස්ථානයේ නඩත්තු කරනු ලබන සතුන් සම්බන්ධ පොත්, ලේඛන හෝ වාර්තා පරීක්ෂා කිරීමට;

(ඇ) මෙම පනත යටතේ වරදක් සිදු කිරීම හෝ සිදු කිරීමට අත්‍යාසන්නව තිබීම සම්බන්ධයෙන්, එම ස්ථානයේ සිටින යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීමට හැකිවේ.

එතෙකුදු වුවද, වරදක් සිදු කිරීම හෝ දිගින් දිගටම සිදු කිරීම වැළැක්වීමට හෝ මෙම පනත යටතේ වරදක් සිදු කිරීම පිළිබඳ සාක්ෂියක් වන යම් ලියවිල්ලක් හෝ වෙනත් දෙයක් විනාශ වීම වැළැක්වීමට හෝ යම් සතෙකුගේ සුභසාධනය ඇති කෙරෙන බව වගබලා ගැනීමට හෝ ඉහතකී පියවරවලින් කවරක් හෝ ගැනීම වහාම අවශ්‍යවන බව ලැබුණු තොරතුරුවලට අනුව පොලිස් පරීක්ෂකවරකුගේ තනතුරට නොඅඩු තනතුරක් දරන පොලිස් නිලධරයකුගේ හෝ පරීක්ෂකවරයකුගේ මතය වන අවස්ථාවක දී එම පොලිස් නිලධරයා හෝ පරීක්ෂකවරයා විසින්, වරෙන්තුවක් ලබාගැනීමට කලින් ඉහතකී යම් පියවරක් ගැනීම නීත්‍යානුකූල විය

යුතු අතර, එබඳු පියවරක් ගැනීමෙන් පැය විසිහතරක් තුළ එසේ ගන්නා ලද පියවර පිළිබඳ වාර්තාවක් ද වරෙන්තුවක් ලබාගැනීමෙන් තොරව එබඳු පියවර ගැනීමට තුඩු දුන් හේතු ද, එම පරීක්ෂකවරයා හෝ පොලිස් නිළධරයා විසින් අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය.

පරීක්ෂකවරුන් විසින් සත්ව සුභසාධන විධාන නිකුත් කිරීම.

**45.** (1) සතෙකු —

(අ) ආරක්ෂාව නොලබන බව ;

(ආ) ප්‍රමාණවත් ආහාර, ජලය සහ වාසස්ථානු නොලබන බව ;

(ඇ) වේදනාවට පත්ව සිටින බව ;

(ඈ) පශු වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍යව සිටින බව ;

(ඉ) වැඩට නුසුදුසුව සිටින අතර, වැඩෙහි යොදවා ඇති බව ;

විශ්වාස කිරීමට තරම් හේතු විමර්ශනයකට පසු පරීක්ෂකවරයාට තිබේ නම්, පහත සඳහන් එකක් හෝ වැඩි ගණනක් ඉටු කරන ලෙස ද නියම කරමින් එම තැනැත්තා වෙත ලිඛිත විධානයක් නිකුත් කරනු ලැබිය හැකි ය:—

(i) විධානයේ සඳහන් කර ඇති ආකාරයට සතාට ආරක්ෂාව සැලැස්වීම හෝ සැලකීම;

(ii) විධානයේ සඳහන් කර ඇති ආකාරයට සතාට ආහාර ජලය, විවේකය, වාසස්ථාන හෝ සෙසු ජීවන තත්ත්වයන් ලබා දීම;

(iii) විධානයේ නියම කර ඇති දිනයක් හෝ වේලාවක් අනුව සතාගේ තත්ත්වය පිළිබඳව පශු වෛද්‍යවරයකුගේ උපදෙස් ලබා ගැනීම;

(iv) ඉහතකී (i), (ii) හෝ (iii) යන උපඡේදවල සඳහන් යම් කාර්යයක් සඳහා සතා ප්‍රතිස්ථානගත කිරීම ; හෝ

(v) නියම කරන ලද වේලාවන් දක්වා හෝ නියම කරන ලද සිද්ධියක් සිදුවීම දක්වා හෝ සතා තබා ඇති ස්ථානයෙන් සතා බැහැරට ගෙන යෑමෙන් වැළකී සිටීම.

(2) එබඳු විධානයක් සත්ව සුභසාධන විධානයක් ලෙස සඳහන් කරනු ලැබිය යුතු අතර, එය මෙහි උපලේඛනයේ දක්වා ඇති ආකෘතිය අනුව විය යුතු ය.

(3) 1වන උපවගන්තියේ සඳහන් කර ඇති පරිදි ක්‍රියා කිරීම සතාගේ උපරිම යහපතට හේතුවන බව පරීක්ෂකවරයකුගේ මතය වන අවස්ථාවක දී එකී (1) වන උපවගන්තියේ සඳහන් ප්‍රතිකර්ම පියවර ගැනීමෙන් පරීක්ෂකවරයා නොවැළැක්විය යුතුය. එබඳු අවස්ථාවකදී, එබඳු පියවර ගැනීමට ඔහුට ඇති හේතු ඔහු විසින් වාර්තාගත කරනු ලැබිය යුතු අතර, ඒ බවට සටහනක් ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ නොපමාවම කළ යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ දෙන ලද යම් විධානයක් පිළිපැදීමට සාධාරන හේතුවක් නොමැතිව අසමත්වන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ, එම දඩය සහ බන්ධනාගාරගත කරනු ලැබීම යන දෙකටම යටත් විය යුත්තේ ය.

(5) යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් මෙම වගන්තිය යටතේ විධානයක් නිකුත් කිරීම නිසාම, එම ක්‍රියාව හෝ නොකර හැරීම සම්බන්ධයෙන් මෙම පනත යටතේ වරදකට අදාළව නඩුවක් පැවරීමට අගතියක් නොවිය යුතු ය.

සතෙකුගේ සුභසාධනය සැලැස්වෙන පරිදි විමර්ශන සහ නඩු විභාග පැවැත්වෙන කාලය තුළ සතුන් වාසස්ථානවල තැබීම.

**46.** වරදක් සිදුකර ඇතැයි හෝ සිදු කරනු ලැබේ යයි හෝ සිදු කිරීමට ඉඩ ඇතැයි කියනු ලබන්නේ හෝ, යම් සතෙකු සම්බන්ධයෙන් ද, එම සතා යෝග්‍ය තැනැත්තකුගේ, රජයේ ගොවිපලක, සත්ව වාසස්ථානයක හෝ එම සතාගේ භාරය පිළිගැනීමට කැමැත්ත දක්වන වෙනත් සුදුසු ආයතනයක් හෝ තැනැත්තකුගේ භාරයේ තැබීම හෝ දිගින් දිගටම වරදක් සිදු කිරීම වැළැක්වීම සඳහා හෝ එම සතාට ආරක්ෂාව හෝ වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම පිණිස අවශ්‍ය වන බවට සෑහීමට පත්වන අවස්ථාවකදී එම සතා එබඳු ස්ථානයක තබන ලෙස පොලිස් නිලධරයකු හෝ පරීක්ෂකවරයකු විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට හෝ තමන්ගේම අභිමතය පරිදි හෝ නියෝගයක් කිරීමට මහෙස්ත්‍රාත්වරයකුට හැකි වන්නේ ය.

**පොලිස් නිලධරයකුට හෝ පරීක්ෂකවරයකුට බාධා කිරීම වරදක් වන බව.**

**47.** මෙම පනත යටතේ බලතල කිසිවක් පාවිච්චි කිරීමේදී පරීක්ෂකවරයකුට හෝ පොලිස් නිලධරයකුට බාධා පමුණුවන හෝ ප්‍රතිරෝධය දක්වන තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන නඩු විභාගයකින් අනතුරුව වරදකරු කරනු ලැබූ විට රුපියල් තුන්දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීම හෝ එම දඩය සහ බන්ධනාගාර ගත කරනු ලැබීම යන දෙකටම හෝ යටත් විය යුත්තේ ය.

**මෙම පනත යටතට වැටෙන වරදවල් සඳහා නඩු පැවරීම.**

**48.** මෙම පනත යටතේ වරදක් සම්බන්ධ නඩු කටයුත්තක්—

(අ) සාම නිලධරයකු විසින්; හෝ

(ආ) අධිකාරිය විසින්; හෝ

(ඇ) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 136 (1) (අ) වන වගන්තියේ විධිවිධාන යටතේ, අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයකුට කරනු ලබන පැමිණිල්ලක් මත හෝ,

පවරනු ලැබිය හැකිය.

**ලඝු ලෙස විභාග කළ හැකි වැරදි.**

**49.** මෙම පනත යටතට හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් යටතට වැටෙන වරදක් සම්බන්ධයෙන් වෙනත් යම් නීතියක පටහැනිව සඳහන් වන කිසිවක් නොසලකාම මහෙස්ත්‍රාත්වරයකු විසින් ලඝු ලෙස විභාග කිරීම සහ ඒ සම්බන්ධයෙන් නියමිත දඬුවම් පැනවීම නීත්‍යානුකූල වන්නේ ය.

**වරදකරු කරනු ලැබීමෙන් පසු රාජසන්තක කිරීම වියදම් ප්‍රතිපූරණය කිරීම.**

**50.** (1) යම් තැනැත්තකු මෙම පනත යටතේ, සතෙකු සම්බන්ධව වරදකට වරදකරු කරනු ලැබූ අවස්ථාවක දී පනවනු ලැබිය හැකි යම් දඬුවමකට අමතරව—

(අ) වරද සිදු කිරීමට අදාළ සතා හෝ සතුන් රාජසන්තක කිරීම;

(ආ) වරද සිදු කිරීමට භාවිතා කරන ලද යම් ආයුධයක් උපකරණයක් හෝ වාහනයක් රාජසන්තක කිරීම;

(ඇ) මෙම පනතේ විධිවිධාන ප්‍රකාර යම් සත්වයකු තබන ලද්දේ කවර තැනැත්තෙකුගේ හෝ ආයතනයක ආරක්ෂාව සහ භාරය යටතේ ද එම තැනැත්තා හෝ ආයතනය විසින් දරන ලද වියදම් ප්‍රතිපූරණය කිරීම

සඳහා මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ නියෝගයක් කිරීමේදී එම සතාගේ රැකවරණය සහ භාරය සුදුසු තැනැත්තකුට, රජයේ ගොවිපොළකට සත්ව වාසස්ථානයකට හෝ වෙනත් යම් යෝග්‍ය ආයතනයකට, අවස්ථාවට අදාළ වන පරිදි, එම ගොවිපොළ, වාසස්ථානය හෝ වෙනත් ආයතනය භාරව සිටින තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ කැමැත්ත ඇතිව දෙන ලෙස විධාන කිරීමට මහෙස්ත්‍රාත්වරයාට හැකිවේ.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ වාහනයක් රාජසන්තක කිරීමේ ආඥාවක් සම්බන්ධයෙන්, (41) වන වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්තිවල සඳහන් විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුත්තේ ය.

## XII වන කොටස

### විවිධ

**51.** (1) මෙම පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) විශේෂයෙන්ම සහ පූර්වෝක්ත බලයේ සාමාන්‍යත්වයට අගතියෙන් තොරව, පහත සඳහන් කාරණාවලින් කවරක් හෝ සම්බන්ධයෙන් මෙම පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය:—

(අ) යම් සතෙකු විසින් උසුලාගෙන යා හැකි හෝ ඇදගෙන යා හැකි උපරිම බර;

(ආ) යම් වාහනයක, කූඩුවක හෝ කොටුවක අධික ලෙස සතුන් පැටවීම වැළැක්වීම සඳහා පිළිපැදිය යුතු කොන්දේසි;

(ඇ) යම් ආකාරයක කටකලියාවක් හෝ ඇඳුමක් භාවිතා කිරීම විධිමත් කිරීම;

(ඇ) ලාබම්කරුවකුගේ ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යෑම විධිමත් කිරීම;

(ඉ) සතුන් ඇල්ලීමේදී යොදාගතයුතු ආරක්ෂා විධිවිධාන;

(ඊ) සතුන් ප්‍රවාහනයේදී යොදාගතයුතු තත්ත්වයන් සහ ක්‍රම;

(උ) මින් මැදුරු සම්බන්ධ කොන්දේසි;

(ඌ) සතුන් බෝ කිරීම, එන්නත් කිරීම සහ වන්ද්‍යාකරණය කිරීම;

(එ) කුකුළන් සම්බන්ධ කොන්දේසි සහ පිළිවෙත් ඇතුළු ගොවිපොළ සතුන් සම්බන්ධ කොන්දේසි;

(ඒ) වාණිජ පදනමක් මත පවත්වාගෙන යන නේවාසික බලු කුඩු, සුරතලුන් සඳහා හෝටල් සහ ඊට සමාන වෙනත් ආයතන;

(ඔ) රඟපෑමේ යෙදෙන සතුන් සම්බන්ධ කොන්දේසි;

(ඕ) සුරතල් සත්ව සාප්පු සම්බන්ධ කොන්දේසි;

(ක) සත්ව ඝාතකාගාර සහ පිළිවෙත් සම්බන්ධ කොන්දේසි ;

(ග) අයාලේ යන සතුන්;

(ජ) විනෝද උද්‍යානවල සිටින සතුන් සම්බන්ධ කොන්දේසි;

(ට) අල්ලා සිරකර තැබූ සතුන් සම්බන්ධ කොන්දේසි;

(ඩ) සතුන් යොදවා ගනිමින් කෙරෙන අත්හදාබැලීම් සම්බන්ධ කොන්දේසි;

(න) පළිබෝධ පාලනයට සම්බන්ධ කොන්දේසි.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කළයුතු අතර, එසේ පළකරනු ලැබූ දිනයේදී හෝ එම නියෝගයේ සඳහන් කරනු ලැබිය හැකි දිනයකදී ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම, ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකි තරම් කලින් දිනයකදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු ය. පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, අනුමතිය නොලැබූ දිනයේ සිට, එහෙත් එම නියෝගය යටතේ කලින් කරන ලද කිසිවකට අගතියකින් තොරව අවලංගු වූ හැටියට සළකනු ලැබිය යුතු ය.

සතුන් සම්බන්ධ නඩුවලදී මැදිහත්වීමේ අයිතිවාසිකම.

**52.** සතෙකු අධිකරණය ඉදිරියේ පැවැත්වෙන නඩු කටයුත්තක විෂය කාරණය වන්නාවූ අවස්ථාවකදී, සතාගේ යහපත ආරක්ෂා කිරීම පිණිස අධිකාරිය, පරීක්ෂකවරයකු හෝ සත්ව සුභසාධක සමිතියක් විසින් බලය පවරන ලද තැනැත්තකු එම අධිකරණ නීති කෘත්‍යයට මැදිහත්වීම නීත්‍යානුකූල විය යුත්තේ ය.

මෙම පනතේ විධිවිධාන කඩ කිරීම වරදක් බව.

**53.** මෙම පනතේ විධිවිධාන කිසිවක් හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය කරන්නා වූ හැම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු ය.

ප්‍රකාශිතවම විධිවිධාන සලස්වා නැත්තා වූ වරදවල් සඳහා දඬුවම.

**54.** මෙම පනත් යටතේ හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ හෝ යම් දඬුවමක් සඳහා ප්‍රකාශිතවම විධිවිධාන සලස්වා නැති යම් වරදක් සිදු කරන හැම තැනැත්තකුම, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ එම දඩය සහ බන්ධනාගාර ගත කරනු ලැබීම යන දඬුවම් දෙකටම යටත් විය යුතු ය.

පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන වැරදි.

**55.** පුද්ගල මණ්ඩලයක් විසින් මෙම පනත යටතේ වරදක් සිදුකරනු ලබන අවස්ථාවකදී —

(අ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාවක් වන්නේ නම් එම සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකුම; සහ

(ආ) එම පුද්ගල මණ්ඩලය, ව්‍යාපාරික ආයතනයක් වන්නේ නම්, එම ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවකුම,

එම වරදට වරදකරු වන හැටියට සලකනු ලැබිය යුතු ය.

එතෙකුදු වුව ද, එම වරද සිදු කරනු ලැබුවේ තමාගේ දැනුමෙන් තොරව බව හෝ එම වරද සිදුකිරීම වැළැක්වීම සඳහා නිසි උද්‍යෝගයෙන් යුතුව කටයුතු කළ බව එම සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු

හෝ නිලධරයකු හෝ එබඳු ව්‍යාපාරික ආයතනයක හවුල්කරුවකු ඔප්පු කළහොත්, ඔහු එම වරද සම්බන්ධයෙන් වදරකරු වන හැටියට සලකනු නොලැබිය යුතු ය.

වරදකට ආධාර දීම සහ අනුබල දීම.

**56.** මෙම පනත යටතේ වරදක් කිරීමට ආධාර දෙන හෝ අනුබල දෙන හෝ වරදක් සිදු කිරීමට උත්සාහ කරන හෝ කුමන්ත්‍රණය කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර වරදකරු කරනු ලැබූ විට වරද සඳහා විධිවිධාන සලස්වා ඇති දඬුවමකට යටත් විය යුත්තේ ය.

නඩු පැවරිය හැකි කාලය.

**57.** මෙම පනත යටතේ සිදු කරන ලද වරදක් සම්බන්ධ නඩුවක්, එම වරද සිදු කරන ලද දිනයේ සිට මාස දොළහක් ඉකුත්වීමෙන් පසුව පවරනු නොලැබිය යුතු ය.

ව්‍යතිරේකය.

**58.** පලිබෝධ නාශක කටයුතුවලට හෝ මිනිස් ජීවිත හෝ දේපළ ආරක්ෂා කිරීම පිණිස ගන්නා ලද සාධාරණ පියවරවලට මෙම පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

1907 අංක 13 දරන ආඥාපනත පරිච්ඡින්න කිරීම.

**59.** (1) 1907 අංක 13 දරන සත්ව හිංසා වැළැක්වීමේ ආඥාපනත මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ. එකී ආඥාපනත යටතේ ආරම්භ කරන ලද සහ එය පරිච්ඡින්න කරන ලද දිනය වන විට විසඳීමට තිබුණු සියලුම නඩු එම ආඥාපනත තවමත් වලංගුව සිටින ලෙස සලකා තවදුරටත් පවත්වාගෙන ගොස් අවසන් කළ යුතු ය.

(2) සත්ව හිංසා වැළැක්වීමේ ආඥාපනත යටතේ නිකුත් කරන ලද හෝ සාදන ලද සහ මෙම පනතේ මෙම කොටස ක්‍රියාත්මක වීම ආරම්භවූ දිනයට කලින් දිනය දක්වා බලපවත්වනු ලැබූ සියලුම නියෝග, ප්‍රකාශන, ආඥා සහ නිවේදන, ඒවා මෙම පනතට අනනුකූල නොවන ප්‍රමාණයට තවදුරටත් බලපැවැත්විය යුතු අතර, මෙම පනත යටතේ නිකුත් කරන ලද හෝ සාදන ලද ලෙස සැලකිය යුතු අතර, මෙම පනත යටතේ පරිච්ඡින්න කරනු ලබන හෝ අවලංගු කරනු ලබන තෙක් එසේ වලංගුව පැවතිය යුත්තේ ය..

සත්ව පනතේ 38 වගන්තිය යටතේ සතා යන්නෙහි අර්ථ නිරූපණය

**60.** (1988 අංක 46 දරන පනතින් සංශෝධිත) 1958 අංක 29 දරන සත්ව පනතේ 38 වන වගන්තියේ “සතා” යන්නෙහි අර්ථ නිරූපණය පරිච්ඡින්න කිරීම සහ ඒ සඳහා පහත සඳහන් අර්ථ නිරූපණය ආදේශ කිරීම මගින්, තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"සතා" යන්නෙන්, එළ හරකා හෝ මීහරකා අදහස්වන අතර, 3 ඇ වගන්තියේ සහ iv වන කොටස් දී, බැටළුවකු එළුවකු, ඌරකු හෝ කුකුළන් ද ඇතුළත් වේ.

සතුන් සම්බන්ධ වෙනත් පනත් සමග අනනුකූල වන්නේ නම් මෙම පනත වලංගුව පැවතිය යුතු බව.

61. මෙම පනතේ විධිවිධාන සහ සතුන් සම්බන්ධ වෙනත් යම් පනතක විධිවිධාන අතරේ අනනුකූලතාවයක් ඇති වුවහොත්. මෙම පනතේ විධිවිධාන වලංගුව පැවතිය යුත්තේ ය.

## XIII වන කොටස

### පොදු විධිවිධාන

තොරතුරු ඉල්ලා සිටීමට අධිකාරියට හැකි බව.

62' (1) මේ පනතේ 14 වන වගන්තිය සහ 15 වන වගන්තිය යටතේ බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, සාධනය කිරීමට සහ ඉටු කිරීමට අධිකාරියට හැකියාව ලබාදීමේ කාර්යය සඳහා නිශ්චය කරනු ලැබිය හැකි යම් සතෙකු සම්බන්ධ යම් වාර්තාවක් හෝ තොරතුරක් දැන්වීමේ සඳහන් කරනු ලබන යම් කාල පරිච්ඡේදයක් තුළ අධිකාරියට හෝ බලය දෙනු ලැබූ තැනැත්තා වෙත ඉදිරිපත් කරන ලෙස, අධිකාරිය හෝ තත් කාර්යය සඳහා බලය දෙනු ලැබූ තැනැත්තන් විසින් ලිඛිත දැන්වීමක් මගින් නියම කරනු ලැබිය හැකි ය.

(2) යම් වාර්තාවක් හෝ තොරතුරක් ඉදිරිපත් කරන ලෙස (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් මගින් යම් තැනැත්තකුට නියම කරනු ලැබ ඇති අවස්ථාවකදී, එම වාර්තාව ඉදිරිපත් කිරීමෙන් හෝ එබඳු තොරතුරු ඉදිරිපත් කිරීමෙන් යම් නීතියක විධිවිධාන යටතේ එම තැනැත්තා වළක්වනු ලැබ ඇත්නම් මිස, එම දැන්වීමේ සඳහන් කර ඇති කාලපරිච්ඡේදය තුළ එකී නියමය අනුව කටයුතු කිරීම එම තැනැත්තාගේ වගකීම වන්නේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද යම් තොරතුරක් බාහිර තැනැත්තකුට එළිදරව් කළයුතු යයි අධිකරණයක් විසින් නියම කරනු ලැබ ඇති අවස්ථාවලදී හැර, අධිකාරියේ සාමාජිකයකු, නිළධරයකු හෝ සේවකයකු විසින් එබඳු තොරතුරු අධිකාරියේ කාර්යයන් සඳහා හැර, අධිකාරියෙන් බාහිර යම් තැනැත්තකුට එළිදරව් නොකළ යුතු ය.

**63.** මෙම අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව අධිකාරිය උපලේඛනගත ආයතනයක් විය යුතු බව.

**64.** අධිකාරියේ සියලුම සාමාජිකයන්, නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යයන් සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අධිකාරියේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**65.** (1) අධිකාරියේ යම් කාර්යයක් සඳහා රජයේ යම් නිශ්චල දේපළක් අවශ්‍ය වන අවස්ථාවක දී, එම කාර්යය, රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ එම දේපළ විශේෂ ප්‍රදානයක් හෝ බදු දීමක් කරනු ලැබිය හැක්කේ යම් කාර්යයක් සඳහා ද, එම කාර්යය ලෙස සළකනු ලැබිය යුතු අතර, ඒ අනුව, එම ආඥාපනතේ විධිවිධාන අධිකාරියට එම දේපළ ප්‍රදානය කිරීමක් හෝ බදුදීමක් සම්බන්ධයෙන් අදාළ විය යුත්තේ ය.

(2) අධිකාරියේ යම් කාර්යයක් සඳහා රජයේ යම් චංචල දේපළක් අවශ්‍යවන අවස්ථාවකදී, එම චංචල දේපළෙහි සන්තකය සහ පාවිච්චිය, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් අධිකාරියට මාරු කරනු හා පවරනු ලැබිය හැකි ය:

එසේවුවද, රජයේ චංචල දේපළකට බලපාන කිසිම නියමයක්, එම දේපළ පිළිබඳ පාලනය සතුවන අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව, මෙම උපවගන්තියේ මීට කලින් සඳහන් විධිවිධානයන් යටතේ අමාත්‍යවරයා විසින් සාදනු නොලැබිය යුතු ය.

චංචල සහ නිශ්චල යන දෙයාකාරයේම රජයේ දේපළ අධිකාරිය සඳහා ලබාදිය යුතු බව.

**66.** (1) අධිකාරියේ යම් විශේෂ කාර්යයක් සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීමට අවශ්‍ය වන්නා වූ සහ එම කාර්යය සඳහා යෝජිත අත්කරගැනීම ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරන්නා වූ අවස්ථාවක දී, එම දේපළ පොදු කාර්යයක් සඳහා අවශ්‍ය වන හැටියට සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගෙන, අධිකාරිය වෙත පවරනු ලැබිය හැකි ය.

ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නිශ්චල දේපළ අත්කර ගැනීම.

(2) අධිකාරිය සඳහා, ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම සඳහා ගෙවිය යුතු යම් මුදලක්, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මෙම පනත යටතේ හෝ අධිකාරියේ විධානය අනුව හෝ කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

**67.** (1) (අ) අධිකාරිය විසින් මෙම පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන, යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකාරියට විරුද්ධව; හෝ

(ආ) අධිකාරියේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් මෙම පනත යටතේ හෝ අධිකාරියේ විධානය යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව,

යම් සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) මෙම පනත යටතේ හෝ අධිකාරියේ විධානය මත යම් තැනැත්තකු විසින් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියෙහි ගෙන එන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවකදී, (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් කර ඇති පරිදි එබඳු යම් තැනැත්තකු විසින් දරන ලද යම් වියදමක් ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද බවට අධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත් අධිකාරියේ අරමුදලින් ගෙවිය යුතු ය.

අමාත්‍යවරයා වෙත තොරතුරු ඉදිරිපත් කිරීම.

**68.** අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයට, අධිකාරියේ වැඩ කටයුතු සම්බන්ධ වාර්තා, ගිණුම් සහ වෙනත් තොරතුරු අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලෙස අධිකාරියට නියම කිරීමට හෝ විධානය කිරීමට අමාත්‍යවරයාට හැකි වන්නේ ය.

වාර්ෂික වාර්තාව.

**69.** අධිකාරිය විසින් වර්ෂය තුළ ස්වකීය බලතල සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සහ සාධනය කිරීම පිළිබඳ ස්වකීය ප්‍රතිපත්තිය සහ වැඩ සටහන පිළිබඳව ද වාර්තාවක් අධිකාරියේ එක් එක් මුදල් වර්ෂය අවසානයෙන් මාස හතරක් ඇතුළත, අධිකාරිය විසින් ජාතික භාෂාවලින් ප්‍රකාශයට පත් කොට, අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. එම වාර්තාවේ පිටපතක් අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

## XIV වන කොටස

### අර්ථ නිරූපණය

**70.** පද සම්බන්ධය අනුව වෙනත් අර්ථයක් අවශ්‍ය වුවහොත් නම් මිස මෙම පනතෙහි— අර්ථ නිරූපණ.

"සතා" යන්නෙන්, මනුෂ්‍යයකු හැර වෙනත් ඕනෑම ජීවත්වන සතෙකු අදහස් වන අතර, මෙහි මින්මතු අර්ථ දක්වා ඇති ආකාරයට, ගෘහාශ්‍රිත සතෙකු, ගොවිපොළ සතෙකු, අල්ලා සිරකර තැබූ සතෙකු සහ වන සතෙකු, සහචර සතෙකු, අයාලේ යන සතෙකු සහ ආහාර සතෙකු අදහස් වේ ;

"අල්ලා සිරකර තැබූ සතෙකු" යන්නෙන්, ගෘහාශ්‍රිත සතෙකු හෝ ගොවි පළ සතෙකු නොවන සත්වෝද්‍යානයක, සර්කස් ක්‍රීඩාවක හෝ වැඩ හෝ උත්සව හෝ වෙනත් යම් කාර්යයක් සඳහා වෙනත් ආකාරයකට සිරකොට තබනු ලබන සතෙකු අදහස් වේ ;

"සත්ව වාසස්ථානයක්" යන්නෙන්, සතුන් ආරක්ෂා සහිතව තැබීම හෝ නඩත්තු කිරීම සඳහා පාවිච්චි කරනු ලබන වාසස්ථානයක්, ගිලන් හලක් හෝ වෙනත් යම් ස්ථානයක් හෝ සංක්‍රාම ස්ථානයක් අදහස් වේ ;

"අධිකාරිය" යන්නෙන්, මෙම පනතේ II වන කොටස යටතේ පිහිටුවන ලද ජාතික සත්ව සුභසාධන අධිකාරිය අදහස් වේ ;

"ආයුර්වේද වෛද්‍ය සභාව" යන්නෙන්, 1961 අංක 31 දරණ ආයුර්වේද වෛද්‍ය සභා පනත යටතේ පිහිටුවන ලද ආයුර්වේද වෛද්‍ය සභාව අදහස් වේ;

"කූඩුව" යන්නට උෟරු කොටුවක්, බලු කූඩුවක් හා කූඩුවක් හෝ වෙනත් යම් කොටුකළ ස්ථානයක් ඇතුළත් වේ;

"මධ්‍යම පරිසර අධිකාරිය" යන්නෙන්, 1980 අංක 47 දරන ජාතික පරිසර පනත මගින් පිහිටුවන ලද, මධ්‍යම පරිසර අධිකාරිය අදහස් වේ ;

"සභාපති/ සභාපතිනිය" යන්නෙන්, මෙම පනතේ 9 වන වගන්තිය යටතේ පත් කරන ලද අධිකාරියේ සභාපති/ සභාපතිනිය අදහස් වේ ;

"සහචර සත්වයා" යන්නට, මඟ පෙන්වන්නකු හෝ සුරතලෙකු වශයෙන් තබාගන්නා සතෙකු ඇතුළත් වේ;

සතෙකු සම්බන්ධයෙන් වන විට "සිරකර තැබීම" යන්නෙන්—

(අ) ප්‍රවේශයේ සහ යැම්ඊම් කිරීමේ නිදහස සීමාවන පරිදි කූඩුවක, වළක, අංගනයක, කුඹුරක හෝ සක්මන් කොටුවක ඇතුළත් කර තැබීම; සහ

(ආ) අත්පා බැඳීමෙන්, කණුවක බැඳීමෙන් හෝ වෙනත් යම් ආකාරයක සීමා කිරීම,

ඇතුළුව එම සතාගේ යැම් ඊම් පිළිබඳ නිදහස සීමා කිරීම ඇතුළත් වේ;

"අධ්‍යක්ෂ" යන්නෙන්, මෙම පනත යටතේ පත්කරනු ලබන අධ්‍යක්ෂ අදහස් වන අතර, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු සහ සහකාර අධ්‍යක්ෂවරයකු ඊට ඇතුළත් වේ;

"ගෘහාශ්‍රිත සත්වයකු" යන්නෙන්—

(i) අදාළ අවස්ථාවේදී එම සත්වයා සුරතලෙකු ලෙස තබාගනු ලබන්නේ ද නැද්ද යන බව නොසලකාම, සුරතලුන් ලෙස සාමාන්‍යයෙන් තබාගනු ලබන වර්ගයක සත්වයකු;

(ii) යම් සතෙකු සුරතලෙකු ලෙස තබාගනු ලැබ ඇත්තේ හෝ තබාගනු ලබන්නේ නම්, එම වර්ගයට අයත් සත්වයකු;

(iii) පිටෙහි නැඟ යෑම, දිවීමේ තරඟ, ප්‍රවාහනය, වැඩ, බෝකිරීම හෝ ප්‍රදර්ශනය සඳහා යොදාගනු ලබන යම් සත්වයකු;

(iv) ආරක්ෂකයකු, හෝ මඟ පෙන්වන්නකු හෝ සහචර සත්වයකු ලෙස යොදාගනු ලබන සත්වයකු,

අදහස් කෙරේ;

"ගොවිපොළ සත්වයකු" යන්නෙන්, කෘෂිකාර්මික හෝ කිරි ලබාගැනීම හෝ පශු සම්පත් කාර්යයන් සඳහා තබාගනු ලබන හෝ පාවිච්චි කරනු ලබන සත්වයකු අදහස් කෙරෙන අතර, කුකුළන් ද ඊට ඇතුළත් වේ;

"ආහාර සත්වයකු" යන්නෙන්, මනුෂ්‍යයන් විසින් ආහාර වශයෙන් මස් පරිභෝජනය කරනු ලබන සත්වයකු අදහස් කෙරේ;

"පරීක්ෂකවරයකු" යන්නෙන්, 16 වන වගන්තිය යටතේ පත් කරන ලද සත්ව සුභසාධන පරීක්ෂකවරයකු අදහස් කෙරේ;

"අසාධු සැලකීම" යන්නෙන්, සත්වයකු සම්බන්ධයෙන් වන විට, යම් ක්‍රියාවක්, මාදිලිය හෝ ප්‍රමාණය හෝ එහි අරමුණ හෝ එය සිදු කරනු ලබන අවස්ථාගත කරුණු අනුව සලකන විට, කෲර වන්නාවූ යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් මගින් සතෙකුට වේදනාවක් හෝ ආපදාවක් සිදු කිරීම අදහස් වේ ;

"ගිලන්හලක්" යන්නෙන්, රෝගී හෝ වයස්ගත වූ හෝ ආබාධිත සතුන් තබාගැනීම සඳහා පිහිටුවා ඇති වාසස්ථානයක් අදහස් කෙරේ;

"පළාත්පාලන ආයතනය" යන්නෙන්, මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් ද අදහස් කෙරෙන අතර, එවැනි යම් සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන, ඉටු කරනු ලබන හෝ සාධනය කරනු ලබන බලතලවලට, කර්තව්‍යයන්ට අනුරූප වන හෝ සමාන වන බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීමට හෝ සාධනය කිරීමට යම් නීතියක් විසින් හෝ යටතේ හෝ ඇති කරන ලද හෝ පිහිටුවන ලද යම් සභාවක් ඊට ඇතුළත් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, සත්ව සුභසාධක කටයුතු භාරව කටයුතු කරන අමාත්‍යවරයා අදහස් වේ ;

සතෙකු සම්බන්ධයෙන් වන විට "පමණට වැඩි ඇවිදවීම" යන්නෙන් කෲර හෝ ආපදා තත්ත්වයන් යටතේ, බලකරනු ලැබූ ඇවිදවීම අදහස් වේ ;

"වේදනාව" යන්නට ආපදාව සහ මානසික හෝ භෞතික දුක ඇතුළත් වේ;

"සාම නිලධාරියා" යන්නට පොලිස් නිලධාරීන් සහ පොලිස් කාර්යයන් ඉටු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයකු විසින් ලියවිල්ලකින් පත් කරන ලද ග්‍රාම නිලධාරීන් ඇතුළත් වේ ;

"තැනැත්තා" යන්නට සංස්ථාගත හෝ සංස්ථාගත නොවන යම් පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ;

"සතෙකුගේ භාරය ඇති තැනැත්තා" යන්නෙන්,—

(අ) සත්වයා අයිතිව සිටින හෝ, සත්වයාට හෝ සත්වයා සම්බන්ධයෙන් බද්දක්, බලපත්‍රයක් හෝ වෙනත් යම් හිමිකම් අයිතිවාසිකමක් ඇත්තා වූ; හෝ

(ආ) නීත්‍යානුකූලව හෝ වෙනත් ආකාරයකට සත්වයාගේ භාරය ඇත්තා වූ; හෝ

තැනැත්තකු අදහස් වේ ;

පක්ෂියකු සම්බන්ධයෙන් වන විට "බැඳ තැබීම"යන්නෙන් පක්ෂියකුගේ අත්තටු අක්‍රිය කිරීම හෝ පක්ෂියකුගේ අත්තටුවලින් කොටසක් ඉවත් කිරීම අදහස් වේ ;

"සන්තකය" යන්නට පාලනය සහ භාරය ඇතුළත් වේ;

"නියමිත" යන්නෙන් මෙම පනත මගින් හෝ එය යටතේ හෝ නියමිත බව අදහස් වේ ;

සත්වයකු සම්බන්ධයෙන් වන විට "පර්යේෂණ" යන්නෙන්, සත්වයකු යොදා ගනිමින් කරනු ලබන අත්හදාබැලීමක්, කාර්ය පටිපාටියක්, පරීක්ෂණයක් හෝ අධ්‍යයනයක් අදහස් කෙරෙන අතර, යම් සතෙකු ශල්‍ය, වෛද්‍ය, මනෝ විද්‍යාත්මක, ජීව විද්‍යාත්මක, රසායනික හෝ භෞතික ප්‍රතිකාරයකට භාජනය කිරීම ද ඊට ඇතුළත් වේ;

"අයාලේ යන සත්වයකු" යන්නෙන්, නිදහසේ හැසිරෙන සත්වයකු හෝ අතහැර දමන ලද සත්වයකු යම් වීදියක, මාර්ගයක හෝ පොදු ස්ථානයක එහා මෙහා ඇවිදින වනචාරී නොවන සත්වයකු අදහස් කෙරේ;

"උගුල" යන්නෙන්, සතෙකු මැරීමේ, හසුකර ගැනීමේ, අල්ලා ගැනීමේ, සීමාකර තැබීමේ හෝ අකර්මණ්‍ය කිරීමේ කාර්යය සඳහා භාවිතා කරනු ලබන දැළක්, කූඩුවක්, මන්දක්, ගාලක්, බොරුවලක් හෝ විද්‍යුත් උපකරණයක් හෝ යාන්ත්‍රික දෙයක් අදහස් කෙරෙන නමුත්—

(i) සතෙකු මෙහෙයවීම, ගාල් කිරීම හෝ එක් රැස්කිරීම සඳහා භාවිතා කරනු ලබන වැටකින් සීමාකළ ඉඩමක් හෝ වෙනත් එලදායි කොටුවක්; හෝ

(ii) යම් සතෙකු ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කරනු ලබන කූඩුවක් වැනි කොටුවක්,

ඊට ඇතුළත් නොවේ;

“විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව” යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මගින් පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අදහස් වේ;

“වාහනය” යන්නෙන්, සතෙකු ප්‍රවාහනය කිරීමේ ක්‍රමයක් වශයෙන් භාවිතා කරනු ලබන යම් රථයක් අදහස් වේ ;

“පශු වෛද්‍යවරුන් සහ වෘත්තිකයන්ගේ සභාව” යන්නෙන්, 1956 අංක 46 දරන පශු වෛද්‍යවරුන් සහ වෘත්තිකයන් පනත යටතේ පිහිටුවන ලද පශු වෛද්‍යවරුන් සහ වෘත්තිකයන්ගේ සභාව අදහස් වේ;

“පශු වෛද්‍යවරයා” යන්නෙන්, 1956 අංක 46 දරන පශු වෛද්‍යවරුන් සහ වෘත්තිකයන් පනත යටතේ ලියා පදිංචි වූ පශු වෛද්‍යවරයකු අදහස් වන අතර, පශු වෛද්‍ය වෘත්තිකයකුද ඊට ඇතුළත් වේ;

සතෙකුට “පශු වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම” යන්නෙන්,—

(i) සතෙකුගේ තත්ත්වය ගැන පශු වෛද්‍යවරයකුගෙන් උපදෙස් ලබාගැනීම; හෝ

(ii) පශු වෛද්‍යවරයකු විසින් සතෙකුට කරන ලද වෛද්‍ය හෝ ශල්‍ය වෛද්‍ය කාර්ය පටිපාටිය; හෝ

(iii) සතෙකුට සිදු කරන ලද සුව කිරීමේ හෝ වැළැක්වීමේ ස්වභාවයෙන් යුත් වෛද්‍ය කාර්ය පටිපාටියක්,

අදහස් වේ ;

“සතෙකුගේ සුභ සාධනය” යන්නට, සතෙකුගේ සෞඛ්‍යය ආරක්ෂාව සහ යහපත ඇතුළත් වේ;

“වන සතෙකු” යන්නෙන්, අලියකු හෝ වනසත්ව සහ වෘක්ෂලතා ආරක්ෂා ආඥාපනතේ උපලේඛනවල ලැයිස්තුගත කර ඇති, අල්ලා සීරකර නැති වෙනත් සත්ව වර්ගවල සතුන් අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**71.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

*උපලේඛනය* *(45 (2) වගන්තිය)*

*සත්ව සුභසාධන විධානය*

*සතා භාරව සිටින තැනැත්තාගේ නම:—*

*ඔහුගේ / ඇයගේ ලිපිනය:—*

*සතා තබා ඇති ස්ථානයේ ලිපිනය:—*

*සතා අඳුනා ගැනීම, කිසිවක් ඇත්නම්:—*

*විශේෂ සළකුණු, කිසිවක් ඇත්නම්:—*

*ගැහැණු සතෙක්ද පිරිමි සතෙක්ද බව, සනය හා වර්ගය:—*

*සතා තබා ඇති තත්ත්වය:—*

*නිකුත් කල විධානය:—*

*සටහන්, කිසිවක් ඇත්නම්:—*

*දිනය හා වේලාව:—*

*පරීක්ෂකවරයාගේ අත්සන:—*

*නම හා තනතුර:—*

**සතා භාරව සිටින තැනැත්තාගේ ප්‍රකාශය**

සතා/සතුන්ගේ යහපත සඳහා මා වෙත නිකුත් කර ඇති ඉහත සඳහන් විධානය ඉෂ්ට කිරීමට මම එකඟ වෙමි. මෙමගින් එකී විධානය අනුව ක්‍රියාකිරීමට මා පොරොන්දු වන අතර, එසේ නොකලහොත් සත්ව සුභසාධන පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් මා වෙත චෝදනා පැවරිය හැකි බව මා දනිමි.

සතා භාරව සිටින තැනැත්තාගේ අත්සන:—

දිනය:—

(විධානය අනුව ක්‍රියාකිරීම ප්‍රතික්ෂේප කළහොත්, ඒ බව හා ඒ සම්බන්ධයෙන් ඔහු විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගය පරීක්ෂකවරයා ඉහත සටහන් තීරුවේ වාර්තා කළ යුතුවේ.)

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.